# වැඩක් කළ හැකි කැබිනට්ටුවක්

- විදේශ කටයුතු
- මහජන සේවා
- ආරක්ෂක
- අධිකරණ
- ආර්ථික කටයුතු
- වරාය, නාවික හා සිවිල් ගුවන් සේවා
- කෘෂිකර්මය
- මූල්‍ය සහ සැලසුම්
- සෞඛ්‍ය
- ස්වදේශ කටයුතු සහ රාජ්‍ය පරිපාලන
- පරිසර
- කම්කරු
- අධ්‍යාපන සහ පර්යේෂණ
- පවුල් සහ ප්‍රජා සංවර්ධන
- සමාජ සහ සංස්කෘතික

රජයේ අකාර්යක්ෂමභාවය අවම කිරීම සඳහා

**ආදර්ශ අමාත්‍යංශ 15ක්**

VERITÉ RESEARCH
Strategic Analysis for Asia

# මුල්‍ය සහ සැළසුම්

## ක්‍රියාකාරීත්වය

- ජාතික සැළසුම් සම්පාදනය කිරීම සහ රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් තීරණය කිරීම
- වාර්ෂික අයවැය සම්පාදනය කිරීම සහ රජයේ ආයතන හා ව්‍යාපෘතිවලට සම්පත් වෙන්කිරීම

## පිහිටුවන්නේ ඇයි

- අයවැය සහ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් අතර මනා ගැලපීමක් තිබෙන බව සහතික කිරීමේ අරමුණ ඇතිව

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

| | | |
|---|---|---|
| මුල්‍ය, ආර්ථික කටයුතු සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යංශය<br>ආයතන 48ක් | ආරක්ෂක අමාත්‍යංශය<br>ආයතන 01ක් | අභ්‍යන්තර වෙළද කටයුතු, ආහාර සුරක්ෂිතතා සහ පාරිබෝගික සුභසාධන අමාත්‍යංශය<br>ආයතන 01ක් |

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)

# අධිකරණ

## ක්‍රියාකාරීත්වය

- අධිකරණ පද්ධතිය සහ උසාවි පරිපාලනය
- සිරගෙවල් පරිපාලනය
- නීති ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම

## පිහිටුවන්නේ ඇයි

- සමස්ත නීති පද්ධතිය පරිපාලනය කිරීමට එක් අමාත්‍යංශයක් ඇති කිරීම
- නීතිවලට සිදුකෙරෙන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන ආයතන අතර දැනුම සහ අත්දැකීම් හුවමාරුව දියුණු කිරීම

යන අරමුණු ඇතිව

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

අධිකරණ, මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය

ආයතන 17ක්

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)
මේ දක්වා පැවැති කැබිනට් මණ්ඩලවල වූ සමාන අමාත්‍යංශ ද, අධ්‍යනය කර ඇත.

# කෘෂිකර්මය

## ක්‍රියාකාරීත්වය

- අස්වැන්න පදනම් කරගත් කෘෂිකර්මාන්ත කටයුතු සංවර්ධනය කිරීම, කෘෂිකර්මාන්තය ආශ්‍රිත සේවා සහ පොහොර ගොවියන් වෙත සැපයීම
- සත්ත්ව පාලනය සහ පශුසම්පත් ආශ්‍රිත නිෂ්පාදනයන් සංවර්ධනය කිරීම
- වාර්මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ධීවර සහ ජලජ සම්පත් සංවර්ධනය කිරීම

## පිහිටුවන්නේ ඇයි

- කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ තිබෙන උප කොටස් අතර සම්බන්ධීකරණය සහ සැලසුම් සකස් කිරීමේ කටයුතු දියුණු කිරීම
- ආහාර ආරක්ෂාව සහ ආහාර සපයාගැනීමේ හැකියාව වර්ධනය කිරීම

යන අරමුණු ඇතිව

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ දුෂ්කර ප්‍රදේශ සංවර්ධන අමාත්‍යංශය
ආයතන 26ක්

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යංශය
ආයතන 07ක්

වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යංශය
ආයතන 28ක්

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)
මේ දක්වා පැවැති කැබිනට් මණ්ඩලවල වූ සමාන අමාත්‍යංශ ද, අධ්‍යනය කර ඇත.

# ආරක්ෂාව

## ක්‍රියාකාරීත්වය

- අභ්‍යන්තරයෙන් සහ බාහිරින් රාජ්‍යය වෙත එල්ලවන තර්ජනයන්ට ප්‍රතිචාර දැක්වීම
- ස්වභාවික ආපදා තත්ත්වයක දී, වහා ප්‍රතිචාර දැක්වීම

## පිහිටුවන්නේ ඇයි

- රාජ්‍ය ආරක්ෂාව පවත්වාගැනීමට සහ අදාළ විවිධ විෂය පථයන් අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගැනීමට එක් තනි අමාත්‍යංශයක් ඇතිකිරීමේ අරමුණ ඇතිව

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

ආරක්ෂක අමාත්‍යංශය

ආයතන 18ක්

P

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)
මේ දක්වා පැවැති කැබිනට් මණ්ඩලවල වූ සමාන අමාත්‍යංශ ද, අධ්‍යනය කර ඇත.

# අධ්‍යාපන හා පර්යේෂණ

## ක්‍රියාකාරීත්වය

- පෙර පාසල්, ප්‍රාථමික සහ ද්විතියීක අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් ජාතික මට්ටමින් සැළසුම් සකස් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම
- විශ්වවිද්‍යාල කළමනාකරණය කිරීම සහ උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම
- තරුණයන් හා අදාළවන ගැටලු කළමනාකරණය කිරීම සහ අනාගත රැකියා අවස්ථා දියුණු කිරීම
- වෘත්තිය පුහුණු අවස්ථා ලබාදීම සහ වෘත්තිය පුහුණු ආයතනයන් නියාමනය කිරීම
- ආයතන හා විශ්වවිද්‍යාල සමග සම්බන්ධීකරණය පවත්වාගැනීම හරහා විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීම

## පිහිටුවන්නේ ඇයි

- ප්‍රාථමික, ද්විතියීක, තෘතියීක සහ වෘත්තිය පුහුණු ඇතුලු අධ්‍යාපනය ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම අමාත්‍යංශ අතර සම්බන්ධීකරණය පවත්වාගැනීම මගින් සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි වඩා හොඳ සැළසුම් සම්පාදනයක් සිදුවන බව තහවුරු කිරීම

- පර්යේෂණ සහ උසස් අධ්‍යාපන යන ක්ෂේත්‍රයන් එකට එකතු කිරීම හරහා එම විෂයන් දෙක අතර සම්බන්ධීකරණය දියුණු කිරීම

යන අරමුණු ඇතිව

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)
සිංගප්පූරුව, ස්විට්සර්ලන්තය, සහ ජපානය යන රටවල මේ හා සමාන ක්‍රියාකාරීත්වයක් ඇති අමාත්‍යංශ පවතී.

# අධ්‍යාපන හා පර්යේෂණ

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

අධ්‍යාපන අමාත්‍යංශය
ආයතන 08ක්

උසස් අධ්‍යාපනය, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යංශය
ආයතන 28ක්

නිපුණතා සංවර්ධන, රැකියා සහ කම්කරු සබඳතා අමාත්‍යංශය
ආයතන 08ක්

අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යංශය
ආයතන 05ක්

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988) සිංගප්පූරුව, ස්විට්සර්ලන්තය, සහ ජපානය යන රටවල මේ හා සමාන ක්‍රියාකාරීත්වයක් ඇති අමාත්‍යංශ පවතී.

# විදේශ කටයුතු

## ක්‍රියාකාරීත්වය

- විදේශ රටවල් හා ශ්‍රී ලංකාව අතර පවත්නා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා කළමනාකරණය කිරීම

## පිහිටුවන්නේ ඇයි

- විදේශ සබඳතා හා අදාළ සියලුම කාරණා එකම අමාත්‍යංශයක් යටතට විමධ්‍යගත කිරීමෙන් විදේශ සබඳතා පවත්වාගැනීම සම්බන්ධයෙන් වන තනි මූලෝපායක් පහසුවෙන්ම ගොඩනගා ගැනීමට අවස්ථාව සළසා ගැනීමේ අරමුණ ඇතිව

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

විදේශ සබඳතා අමාත්‍යංශය

ආයතන 03ක්

P

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)
මේ දක්වා පැවැති කැබිනට් මණ්ඩලවල වූ සමාන අමාත්‍යංශ ද, අධ්‍යනය කර ඇත.

# සෞඛ්‍ය

## ක්‍රියාකාරීත්වය

- සෞඛ්‍ය සේවා සැපයීම සහ රෝහල් සංවර්ධනය කිරීම
- ඖෂධ නිශ්පාදනය කිරීම සහ සිල්ලර වෙළදාම සඳහා ඖෂධ නිශ්පාදනය කරන සමාගම් නියාමනය කිරීම
- වසංගත සහ වෙනත් සෞඛ්‍ය අර්බුදයන් වළක්වාගැනීමට සූදානම් වීම

## පිහිටුවන්නේ ඇයි

- රෝහල් සහ ඖෂධ නිශ්පාදන කටයුතු කළමනාකරණය කිරීම, විමසුමට ලක්කිරීම සහ එම ඖෂධවල ප්‍රසම්පාදන කටයුතු, ආනයනය කිරීම් සහ බෙදාහැරීම් කටයුතු ඇතුලු සෞඛ්‍ය සේවයේ සමස්ත කළමනාකාරීත්වය එකම අමාත්‍යංශයක් යටතට ගෙන ඒමේ අරමුණ ඇතිව

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යංශය
ආයතන 28ක්

ආරක්ෂක අමාත්‍යංශය
ආයතන 01ක්

මූලාශ්‍රය - සිංගප්පූරුව, එමිරේටය, සහ තායිවානයේ කැබිනට් මණ්ඩලවල මේ හා සමාන අමාත්‍යංශයන් පවතී

# කම්කරු

## ක්‍රියාකාරීත්වය

- කම්කරු රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, කම්කරු සුභසාධන කටයුතු සහ රැකියා මට්ටම් කළමනාකරණය කිරීම
- විදේශ රැකියා සහ විදේශයන්හි සේවය කරන්නන්ගේ සුභසාධන කටයුතු නියාමනය කිරීම
- කර්මාන්ත හමුවේ කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටීම සහ වෘත්තීය සමිති සමග ඇති සබඳතා කළමනාකරණය කිරීම

## පිහිටුවන්නේ ඇයි

- කම්කරු විෂය ක්ෂේත්‍රයේ සියලුම කටයුතු හා අදාළ වන එකම අමාත්‍යාංශයක් පිහිටුවීම මෙම අමාත්‍යාංශය කම්කරු ප්‍රතිපත්තිවලට වඩා
- අධ්‍යාපන ප්‍රතිපත්ති මත වැඩි අවධානයක් යොමුකර තිබෙන වෘත්තීය පුහුණු විෂය ක්ෂේත්‍රය භාර අමාත්‍යාංශයෙන් වෙනස් තත්ත්වයක පවත්වා ගැනීම

යන අරමුණු ඇතිව

## වර්තමානයේ පවත්නා අමාත්‍යාංශයන්

කුසලතා සංවර්ධන, රැකියා සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය

ආයතන 11ක්

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)
සිංගප්පූරුව, එමිරේටය, සහ තායිවානයේ කැබිනට් මණ්ඩලවල මේ හා සමාන අමාත්‍යාංශයන් පවතී

# මහජන සේවා

## ක්‍රියාකාරීත්වය

- දුම්රිය මාර්ග සහ අධිවේගී මාර්ග ඇතුලු ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීම
- තැපැල් සේවා සහ විදුලි සංදේශ සේවා ඇතුලු සන්නිවේදන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- විදුලිබලය උත්පාදනය කිරීම, බෙදා හැරීම සහ ඕනෑම බලශක්ති යටිතල පහසුකමක් ඉදිකිරීම
- නගර සංවර්ධනය, සැළසුම් සකස් කිරීම සහ දැරිය හැකි මිලකට ලබාගත හැකි නිවාස ඉදිකිරීම

## පිහිටුවන්නේ ඇයි

- අධිවේගී මාර්ග, බලශක්තිය, සන්නිවේදනය සහ නගර සැළසුම් හා නිවාස වැනි යටිතල පහසුකම්වලට යටත් වන ක්ෂේත්‍රයන් අතර මනා සම්බන්ධීකරණයක් පවතිනු ඇති බව සහතික කිරීම

යන අරමුණ ඇතිව

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)

# මහජන සේවා

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

නාගරික සංවර්ධන, ජල සම්පාදන
සහ නිවාස පහසුකම් අමාත්‍යංශය
ආයතන 17ක්

මහාමාර්ග සහ අධිවේගී මාර්ග අමාත්‍යංශය
ආයතන 02ක්

විදුලිබල සහ බලශක්ති අමාත්‍යංශය
ආයතන 11ක්

තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යංශය
ආයතන 02ක්

ප්‍රවාහන සේවා කළමණාකරන අමාත්‍යංශය
ආයතන 06ක්

ආරක්ෂක අමාත්‍යංශය
ආයතන 04ක්

# වරාය, නාවික හා සිවිල් ගුවන්සේවා

## ක්‍රියාකාරීත්වය

- වරාය සංවර්ධනය කිරීම සහ නැව්ගත කිරීමේ කටයුතු නියාමනය කිරීම
- ගුවන්සේවා හා අදාළ කටයුතු සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීම

## පිහිටුවන්නේ ඇයි

- දිවයිනට ඇතුළුවීමට සහ පිටවීමට හැකියාව ඇති සියලුම මාර්ගයන් එකම අමාත්‍යංශයක් යටතට ගෙන ඒමේ අරමුණ ඇතිව

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

වරාය හා නාවික කටයුතු අමාත්‍යංශය
ආයතන 03ක්

සංචාරක සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යංශය
ආයතන 03ක්

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)

# ආර්ථික කටයුතු

| ක්‍රියාකාරීත්වය | පිහිටුවන්නේ ඇයි |
| --- | --- |
| • සංචාරක ක්ෂේත්‍රය ද, ඇතුලු සියලුම දේශීය ආර්ථික ක්‍රියාකාරීත්වයන් නියාමනය කිරීම<br>• අභ්‍යන්තර වෙළද සහ වානිජ කටයුතු නියාමනය කිරීම<br>• සමාගම් ලියාපදිංචි කිරීම සහ නියාමනය කිරීම<br>• කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සහාය ලබාදීම<br>• අත්‍යාවශ්‍ය භාණ්ඩ දැරිය හැකි මිලකට ලබාගැනීමට හැකි බව සහතික කරමින් පාරිබෝගිකයා ආරක්ෂා කිරීම<br>• අපනයන ප්‍රවර්ධනය සහ වෙළද සබඳතා කළමණාකරනය කරගැනීම | • කර්මාන්ත, වෙළදාම් සහ පාරිබෝගික සුභසාධනය වෙනුවෙන් අදාළ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම එකම අමාත්‍යංශයක් යටතට පත් කිරීමේ අරමුණ ඇතිව |

මූලාශ්‍රය - වෙනත් රටවල මේ හා සමාන අමාත්‍යංශ අධ්‍යනය කර ඇත

# ආර්ථික කටයුතු

## වර්තමානයේ පවත්නා අමාත්‍යාංශයන්

කර්මාන්ත සහ සැපයුම් දාම කළමනාකරණ අමාත්‍යාංශය
ආයතන 23ක්

සංචාරක හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය
ආයතන 04ක්

අභ්‍යන්තර වෙළඳ, ආහාර ආරක්ෂණ සහ පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශය
ආයතන 10ක්

කර්මාන්ත අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
ආයතන 02ක්

කුඩා හා මධ්‍යම පරිමාන ව්‍යාපාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය
ආයතන 06ක්

# ස්වදේශ කටයුතු සහ රාජ්‍ය පරිපාලන

## ක්‍රියාකාරීත්වය

- රාජ්‍ය සේවය කළමනාකරණය කිරීම
- පොලිස් බලකාය කළමනාකරණය කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ දේශසීමා පාලන කටයුතු කළමනාකරණය කිරීම
- පළාත් සහ පළාත් පාලන ආයතන මට්ටමෙහි පාලන ව්‍යුහයන්හි පුද්ගල කළමණාකරන කටයුතු සහ එම ව්‍යුහයන්ට අවශ්‍ය සහාය සැපයීම
- උපත්, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කටයුතු ඇතුලු පරිපාලනය කටයුතු සම්බන්ධව පළාත් පාලන ආයතන සමග සම්බන්ධීකරණය පවත්වාගැනීම

- රාජ්‍ය ඉඩම් පරිපාලනය සහ කළමනාකරණය කිරීම, ඉඩම් ගැටලු නිරාකරණය සහ ඉඩම් ලියාපදිංචි කිරීම සම්බන්ධ කටයුතු කළමනාකරණය සහ ජාතික සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉඩම් ලබාදීම

## පිහිටුවන්නේ ඇයි

- ස්වදේශ කටයුතු සම්බන්ධයෙන් බලය ඇති එකම අමාත්‍යංශයක් පැවතීමෙන් සමස්ත රජයේම රාජ්‍ය නිලධාරී කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)

# ස්වදේශ කටයුතු සහ රාජ්‍ය පරිපාලන

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් පාලන ආයතන අමාත්‍යංශය
ආයතන 13ක්

ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යංශය
ආයතන 07ක්

ආරක්ෂක අමාත්‍යංශය
ආයතන 01ක්

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)

# පවුල් සහ ප්‍රජා සංවර්ධන

## ක්‍රියාකාරීත්වය

- සමාජ සුභසාධන සේවා සැපයීම
- කාන්තාවන්ව සමාජයේ ඉහළට ගෙන ඒම
- අවතැන්ව සිටින්නන් වැනි අනතුරුදායක මට්ටම්වල පසුවන කණ්ඩායම් ආරක්ෂා කිරීමට සහ පුනරුත්ථාපනය කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා සැළසුම් කිරීම
- දරුවන් සඳහා වන සේවා සැපයීම සම්බන්ධව ජාතික මට්ටමින් සැළසුම් සකස් කිරීම සහ සම්බන්ධීකරණ කටයුතු කිරීම

## පිහිටුවන්නේ ඇයි

- දිළිඳුකම දුරලීමට සහ අනතුරුදායක මට්ටම්වල පසුවන කණ්ඩායම් ආරක්ෂා කිරීමට මෙන්ම එම ක්ෂේත්‍රයන් හා බැඳී පවතින වෙනත් විෂය පථයන් සියල්ල එකම අමාත්‍යංශයක් යටතට පත් කිරීමේ අරමුණ ඇතිව

| කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යංශය | **වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්** ප්‍රජා සවිබලගැන්වීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යංශය | අධිකරණ, මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය |
|---|---|---|
| ආයතන 12ක් | ආයතන 06ක් | ආයතන 03ක් |

මූලාශ්‍රය - සිංගප්පූරු කැබිනට්ටුවේ මෙවැනි අමාත්‍යංශයක් ඇත

# පරිසර

## ක්‍රියාකාරීත්වය

- පරිසරය ආරක්ෂා කිරීම සහ රටේ ජෛවවිවිධත්වය සංරක්ෂණය කිරීම
- ජාතික උද්‍යාන සහ වනජීවී කලාප කළමනාකරණය කිරීම
- කාලගුණ තත්ත්වය විමසුමට ලක්කිරීම
- දේශගුණ විපර්යාසය සම්බන්ධව පර්යේෂණ සිදුකර එහි බලපෑම අවම කරගැනීමට නිර්දේශ ඉදිරිපත් කිරීම

## පිහිටුවන්නේ ඇයි

- වෙනම අමාත්‍යංශයක් පිහිටුවීමෙන් පරිසරය සම්බන්ධව ප්‍රතිපත්ති සම්පාදනය කිරීමෙහි ලා ප්‍රමාණවත් අවධානයක් යොමුකිරීමට හැකියාව සළසාදීමේ අරමුණ ඇතිව

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

| පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යංශය | ආරක්ෂක අමාත්‍යංශය |
|---|---|
| ආයතන 13ක් | ආයතන 05ක් |

සිංගප්පූරුව, පින්ලන්තය, ජපානය සහ එමිරේට්ස් යන රටවල කැබිනට් මණ්ඩලයන්ගේ මේ හා සමාන අමාත්‍යංශයන් හඳුනාගත හැකිය

# සමාජ සහ සංස්කෘතික

## ක්‍රියාකාරීත්වය

- රාජ්‍ය මාධ්‍ය ආයතන සහ තොරතුරු ප්‍රචාරණයන් කළමනාකරණය කිරීම
- ආගම හා සම්බන්ධ ප්‍රතිපත්ති කළමනාකරණය කිරීම
- සංස්කෘතිය හා සම්බන්ධ ප්‍රතිපත්ති කළමනාකරණය කිරීම
- ක්‍රීඩා කටයුතු ප්‍රවර්ධනය සහ නියාමනය කිරීම

## පිහිටුවන්නේ ඇයි

- සංස්කෘතික, ආගමික සහ ක්‍රීඩා සම්බන්ධ කටයුතු භාර අදාළ අධිකාරීන් අනුගමනය කරන ප්‍රතිපත්ති රාජ්‍ය මාධ්‍ය ප්‍රතිපත්තීන් හා අනුගත වන බව සහතික කිරීමේ අරමුණ ඇතිව

## වර්තමානයේ පවත්නා අමාත්‍යංශයන්

| | | | |
|---|---|---|---|
| බුද්ධසාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යංශය<br>ආයතන 23ක් | තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යංශය<br>ආයතන 13ක් | ආරක්ෂක අමාත්‍යංශය<br>ආයතන 01ක් | ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යංශය<br>ආයතන 07ක් |

මූලාශ්‍රය - පරිපාලන වෙනස්කම් පිළිබඳ කමිටුවේ 7වැනි වාර්තාවෙන් නිර්දේශ කර ඇති කාණ්ඩ අනුව පොකුරු කිරීම් (1988)
සිංගප්පූරු, තායිවාන, පිත්ලන්ත, එමිරේට්ස් සහ ජපාන කැබිනට්ටුවල මෙවැනි අමාත්‍යංශ හඳුනාගත හැකිය.